රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/99

මගේ අංකය :- ආ1/2/2
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1999 ජුනි මස 05 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**රා.පරි.චක්‍රලේඛ අංක 37/92 යටතේ එස්-2-1 වැටුප් කාණ්ඩය හිමි තනතුරක සිට එස්-2-2 වැටුප් කාණ්ඩය හිමි තනතුරකට උසස් වූ විට වැටුප් පරිවර්තනය කිරීම**

ඉහත සඳහන් වැටුප් කාණ්ඩයන් යටතේ වූ වැටුප් පරිමාණයන් පහත සඳහන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ගින් සංශෝධනය වී ඇත.

I. ලිපිකරු හා සමාන්තර සේවාවලට ද, රියදුරු සේවයට ද අදාළව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 29/94 හා 29/94(1) මගින් 1994.08.01 දින සිට
II. කාර්මික ශිල්පීය ශ්‍රේණිවලට අදාළව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/95 මගින් 1995.01.01 දින සිට
III. රාජ්‍ය සේවයේ අනෙකුත් තනතුරුවලට අදාලව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 33/95 හා 34/95 මගින් 1995.11.01 දින සිට
IV. ඇතැම් දෙපාර්තමේන්ත ුගත තනතුරුවලට අදාලව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/95 අනුව අමාත්‍ය මණ්ඩලය මගින් තීරණය කරන ලද දිනවල සිට,

ඒ අනුව සංශෝධිත වැටුප් පරිමාණයන් මෙසේය.

| වැටුප් කාණ්ඩය | රා.පරි.ච. 37/92 යටතේ වැටුප | සංශෝධිත වැටුප |
|---|---|---|
| එස්-2-1 | රු. 24120 -14x660-6x780-38040 | රු. 29400-5x660-11x780-41280 |
| එස්-2-2 | රු. 27420 -9x660-8x780-39600 | රු. 35640-6x780-9x1200-51120 |

02. ඉහත පරිදි 1994.08.01 සිට 1996.12.31 දක්වා අතරතුර ක්‍රියාත්මක වූ වැටුප් චක්‍රලේඛ මගින් එස්-2-1 වැටුප් කාණ්ඩය හිමි තනතුරක සිට එස්-2-2 වැටුප් කාණ්ඩය හිමි තනතුරකට උසස්වූ නිලධාරීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2/97(III) අනුව පරිවර්තනය කිරීමේදී වැටුපෙහි විෂමතාවයක් හටගෙන ඇත.

03. මෙම විෂමතාවය ඉවත් කිරීම සඳහා අදාළ කාල පරිච්ඡේදය තුළ උසස්වූ නිලධාරීන්ගේ වැටුප් රා.පරි.චක්‍රලේඛ අංක 37/92 හි සඳහන් වැටුප් පරිමාණයන් දිගටම ක්‍රියාත්මක වූවාසේ කල්පිත වශයෙන් සලකමින් උසස්වූ තනතුරට හිමි වැටුප් පරිමාණයට නැවත පරිවර්තනය කළ යුතුය. ඉන් පසු 1996.12.31 දක්වා වැටුප් වර්ධක උපයාගෙන ඇත්නම් එම වැටුප් වර්ධකවල අගයන්ද රා.පරි.ච. 37/92 යටතේ කල්පිත පදනමක් යටතේ එකතු කර 1997.01.01 දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2/97(III)හි අනුරූපී පියවර මත 40% වැඩිවීමට යටත්ව තැබිය යුතුය. එක් එක් නිලධාරියාට 1997.01.01 දින සිට අදාළ වන 40% වැඩිවීම යටතේ ගෙවිය යුතු වැටුප තීරණය කිරීම සඳහා සංශෝධිත පදනම අනුව 1997.01.01 දින සිට හිමිවන වැටුපට 1996.12.31 දිනට අනුරූපී වූ කල්පිත වැටුප

(රා.පරි.ච. 2/97(III) හි ටී-2-2 වැටුප් කාණ්ඩය යටතේ 2 වැනි තීරුවේ සඳහන් වන) යොදා ගත යුතුය.

උදා: "ඒ" නැමැත්තා රා.පරි.ච. 37/92 හි එස්-2-1 වැටුප් පරිමාණයේ 94.02.08 දිනට රු. 28080/- වැටුප් පියවර ලැබුවේය. රා.පරි.ච. 24/94 මගින් එම වැටුප් පරිමාණය 94.08.01 දින සිට රු. 29400-5x660-11x780-41280 වශයෙන් සංශෝධනය විය. ඒ අනුව 96.02.08 වේතනාධිකය ද සමග රු. 35040/- වැටුප් පියවර ලබමින් සිටියේය. ඔහු 96.09.30 දින සිට රු. 35640-6x780-9x1200-51120 වැටුප් පරිමාණය හිමි තනතුරකට උසස් කරන ලදී. ඒ අනුව ඔහුට වැටුප් ගෙවා ඇත්තේ මෙසේය.

| දිනය | වැටුප් පරිමාණය | වැටුප් පියවර | චක්‍රලේඛය |
|---|---|---|---|
| 1994.02.08 | රු. 24120-14x660-6x780-38040 | රු. 28080 | රා.පරි.ච. 37/92 |
| 1994.08.01 | රු. 29400-5x660-11x780-41280 | රු. 33480 (වැටුප් සංශෝධනය) | රා.පරි.ච. 29/94 |
| 1995.02.08 | -එම - | රු. 34260 (වැටුප් වර්ධකය) | -එම - |
| 1996.02.08 | -එම - | රු. 35040 (වැටුප් වර්ධකය) | - එම - |
| 1996.09.30 | රු. 35640-6x780-9x1200-51120 | රු. 36420 (වැටුප් පරිවර්තකය) | රා.පරි.ච. 29/94 හා 11/94 |
| 1997.01.01 | රු. 54480-9x1320-8x1560-78840 | රු. 55800* | රා.පරි.ච. 2/97(III) |
| 1998.01.01 | - එම - | රු. 57120 (96.09.30 වැටුප් වර්ධකය සමග) | - එම - |

*1997.01.01 දින සිට ගෙවන වැටුප 40% වැඩිවීමට යටත්ය.

මෙම නිලධාරියා උසස්වීම් නොලබා සිටියේ නම් ලැබිය හැකිව තිබූ වැටුප මෙසේය.

| | | |
|---|---|---|
| 1994.02.08 | රු. 28080/- | (රා.පරි.ච. 37/92) |
| 1994.08.01 | රු. 33480/- | (රා.පරි.ච. 29/94) |
| 1995.02.08 | රු. 34260/- | (රා.පරි.ච. 29/94) |
| 1996.02.08 | රු. 35040/- | (රා.පරි.ච. 29/94) |
| 1997.01.01 | රු. 58440/-* | (රා.පරි.ච. 2/97(III) |
| 1997.02.08 | රු. 59760/-* | ( ,, ) |

* 1997.01.01 සිට ගෙවන වැටුප 40% වැඩිවීමට යටත්වය.

මෙම වැටුප් පරිවර්තනය කල්පිත වශයෙන් නැවත සකස් කළ යුත්තේ මෙසේය.

| | |
|---|---|
| උසස්වීම් ක්‍රියාත්මක වීමට පෙර අදාළ වූ වැටුප් පරිමාණය (එස්-2-1 රා.පරි.ච. 37/92) | - රු. 24120-14x660-6x780-38040 |
| උසස්වීම් ක්‍රියාත්මක වීමට පෙර ලබමින් සිටි වැටුප් පියවර | - රු. 29400.00 |
| රා.පරි.ච. 11/94 අනුව උපයාගත් කොටස ද සමග වැටුප | - රු. 29823.00 |
| උසස් වූ තනතුරේ වැටුප් පරිමාණය (එස්-2-2 - රා.පරි.ච. 37/92) | - රු. 27420-9x660-8x780-39600 |

උසස්වීම් යටතේ පරිවර්තනය කළවිට ලැබෙන වැටුප - රු. 30720.00

1997.01.01 දිනට අනුරූපී වැටුප රු. 55800 ක් ලැබූ
නිලධාරියෙකුට අදාළ වන නව අනුරූපී වැටුප
රා.පරි.ච. 2/97(III) - රු. 61080.00
1997.01.01 සිට ගෙවිය යුතු වැටුප (වැඩිවීමේ 40% යටතේ) - රු. 54348.00
(1996.12.31 ට අනුරූප වැටුප රු. 39540/- ලෙස සලකා ඇත.)
1997.09.30 වැටුප් වර්ධකය සමග - රු. 55668.00
1998.01.01 සිට ගෙවිය යුතු වැටුප - රු. 62400.00
(වේතනාධිකය උපයාගෙන ඇත්නම් පමණී.)

04. ඉහත 3 වන ජේදය යටතේ අදාළ වූ නිළධාරියාට 1996.12.31 දක්වා දැනට ගෙවා ඇති වැටුපෙහි වෙනසක් නොවිය යුතුය.

05. භාණ්ඩාගාරයේ එකඟත්වය පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

(පී.ඒ. සේනාරත්න)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.